**ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2023**

**------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනතේ අංක 38 දරන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 03 ඡේදය මගින් හඳුන්වා දී ඇති මෙහෙයුම් අත්පොතේ 6.2 ඡේදය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන39ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණු බව. | මුදල් පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 15 වන වගන්තියේ (VI) ඡේදය | අමාත්‍යවරයා විසින් පත්කළ යුතු පාලක සභා සාමාජිකයින් අධ්‍යාපන, මූල්‍ය, නීති සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ය සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් විය යුතු වුවද වර්තමාන පාලක සභාව සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ නිලධාරියකු පත් නොකර නීති ක්ෂේත්‍රයේ නිලධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි. | අලුතින් පත්කිරීමට නියමිත පාලක සභා සාමාජිකභවතුන්ගේ සංයුතියේදී පනතේ විධිවිධාන පරිදි එහි සාමාජියන් පත් කිරීම් සිදු කිරීම පිළිබඳ අමාත්‍යාංශයේ අවධානය යොමු කිරීමට සටහන් කර ගත් බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,519,743ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.53,362,146ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.55,881,889 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පුනරාවර්තන වියදම් සඳහා රජයේ ආධාර රු.18,105,000 කින් හා බාහිර ව්‍යාපෘති ආදායම රු.36,788,598 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ රු. මිලියන 567.4 ක් වූ සමස්ථ ආදායම සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 651.9 ක් දක්වා සියයට 15 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ දී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ඉපයූ ආදායම පිළිවෙලින් රු.මිලියන 84.65 ක් හා රු.මිලියන136.98 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඉපයූ ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 52.33 කින් හෙවත් සියයට 61.8 කින් ඉහළ ගොස් තිබුණි.

ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ සමස්ථ වියදම පිළිවෙලින් රු. මිලියන 534.81 ක් හා රු. මිලියන 560.19 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී සියයට 4.75 කින් ඉහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් 1.1 : 1 ක් හා 1.04 :1 ක් වූ අතර ඉකුත් වර්ෂයේ එම අනුපාතය පිළිවෙලින් 0.6 : 1 ක් හා 0.54 : 1ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විදේශ සිසුන් 200 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් සැපයීම වෙනුවෙන් ඇස්තමේන්තු වටිනාකම රු.190,135,000ක් වූ (වැට් රහිත) නේවාසිකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීමෙන් පසුව 2022 අගෝස්තු 30 දිනට නිමකළ යුතුව තිබුණි. 2022 මැයි මාසය වන විට එම ගොඩනැගිල්ල සඳහා රු.148,336,250 ක් වැය කර භෞතික ප්‍රගතිය සියයට 75 ක් පමණ තිබියදී ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දමා තිබුණි. | විදේශ ශිෂ්‍ය නේවාසිකාගාරයේ ඉදිකිරීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතින අතර කොන්ත්‍රාත් ප්‍රදානය 2024 ජූලි අවසන් සතිය වන විට සිදු කිරීමට නියමිත බව. | මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | බාහිර විභාග ඒකකය සඳහා යෝජිත පස්මහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් ආරම්භ නොකිරීම හේතුවෙන් 2022 ජූලි 01 දින ගිවිසුම අවසන් කිරීමට පාලක සභාව තීරණය කර තිබුණි. මෙම කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මූලික වියදම් වලට අදාල බිල්පතින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ වැඩ ඉංජිනේරු විසින් සහතික කර තිබුණු වැඩ වටිනාකම රු.11,725,461ක් පමණක් වූයෙන් ගෙවා තිබුණු රු.14,508,834ක අත්තිකාරමින් රු.2,783,373ක් ආවරණය කර ගැනීමට නොහැකිව තිබුණි. තවද රු.12,616,373ක් වූ කාර්යසාධන බැඳුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් රු.15,399,746ක මූල්‍යමය පාඩුවක් විශ්වවිද්‍යාලයට සිදුවී තිබුණි. | රට තුළ පැවති කොවිඩ් තත්ත්වය නිසා සංචරණ සීමා පැවති බැවින් ගොඩනැගිලි ඉදිකිරීමට අදාල එක් එක් ආයතන මගින් අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වූ අතර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගොඩනැගිලි ඉදිකිරීම් ආරම්භ කිරීමට පියවර ගත්තද මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම රජය විසින් අත්හිටුවීම මත එම ඉදිකිරීම් ඉටු කිරීමට නොහැකි විය. කෙසේවුවද එම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කිරීමට පාලක සභාවේ අනුමැතිය ලැබී ඇති බැවින් ඒ සඳහා අදාළ ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිත බව. | යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතු අතර අත්තිකාරම් බැඳුම්කරය කල් ඉකුත්වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් වගකිව යුතු පාර්ශව හඳුනා ගෙන රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව විදේශීය අනුබද්ධ ආයතන ප්‍රවර්ධනයට සමායෝජකවරු දෙදෙනෙකු පත්කළ යුතු වුවත් එක් අයෙක් පමණක් පත්කර තිබුණු අතර තානාපති කාර්යාල මගින් විශ්වවිද්‍යාලය පිළිබඳ ප්‍රචාරණ කටයුතු ද ආරම්භ කර නොතිබුණි. ඒ අනුව විදේශීය සිසුන්ගේ ලියාපදිංචියේ වැඩි වීමක් දක්නට නොලැබුණි. | සමස්ථයක් වශයෙන් දේශීය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වුවද විදේශීය ශිෂ්‍යයන් පාඨමාලා හදාරන සංඛ්‍යාවේ ප්‍රමාණාත්මක අඩුවක් තිබෙන බව. ඒ සඳහා රටේ ගෝලීයව පැවති තත්ත්වයත්, ආර්ථික අර්බුධකාරී තත්ත්වයන්ද මෙහිදී සැලකිල්ලට ගත යුතු බව. | ක්‍රියාකාරී සැලැස්මේ දැක්වෙන ඉලක්ක ලඟාකර ගැනිමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාලයේ 2023 - 2027 සංයුක්ත සැලැස්මට අනුව 2023 වර්ෂය සඳහා දේශීය සිසුන් 200 දෙනෙකු සහ විදේශීය සිසුන් 100 දෙනෙකු බඳවා ගැනීමට සැලසුම් කර තිබුණද දේශීය සිසුන් 153 දෙනෙකු සහ විදේශීය සිසුන් 14 දෙනෙකු ලෙස එකතුව සිසුන් 167 දෙනෙකු පමණක් බඳවාගෙන තිබුණි. | 2022 වර්ෂයේ ඇතිවූ ගැටලුකාරී තත්ත්වයන් හේතුකොට ගෙන බඳවාගැනීමේ ක්‍රියාවලිය ප්‍රමාද වූ බැවින් දේශීය (ගිහි/පැවිදි) අයදුම්කරුවන් 153 දෙනෙකු පමණක් බඳවා ගත හැකි වූ බව. | සංයුක්ත සැලැස්මේ ඇතුළත් ඉලක්ක ලඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |